# ලාංකේය ජන සමාජයේ රුක්මණී දේවී ආදර්ශනය පිළිබඳ විමසුමක්

උදිත ගයාෂාන් ගුණසේකර

කැලණිය විශ්වවිද්‍යාලය.

uggunasekara@hotmail.com

මහජනතාව ඉදිරිපිට ප්‍රසිද්ධ වේදිකාවේ, ගැයුම කෙසේ වෙතත් රැඟුම කාන්තාවනට උචිත නොවන බව ලාංකේය ජන සමාජයේ ස්ථාපිත ව තිබූ පොදු පිළිගැනීමකි. එබැවින් ඉඳහිට හෝ රංගනයේ නිරත වූ කාන්තාවනට සම්භාව්‍ය ලාංකික සමාජයේ හිමි ව තිබුණේ අඩු තක්සේරුවකි. මෙම හේතුවෙන් නාට්‍ය, නෘත්‍ය, ටීටර් හා ජනශ්‍රැතික රංග කාර්යයන්හි කාන්තා චරිත නිරූපණය කරන්නට සිදු වූයේ පිරිමින්ට ය. ස්ත්‍රීන්ට රංගනය අකැප බවට මුල්බැස තිබූ මතය වෙනස් කර, වේදිකාවේ කාන්තා චරිතවලට යථාර්ථවත් ලෙස පණපොවන්නට සැබෑ කාන්තාවන්ට හැකියාවක් පවතින බව සනාථ කරමින් කාන්තා චරිතවල උරුමය කාන්තාව සතු කරලන්නට මෙරට පළමු සම්මානනීය රංගවේදිනිය ලෙස සැලකෙන රුක්මණී දේවිය වෙතින් කෙබඳු පුරෝගාමී කාර්යයක් ඉටු වී දැයි සොයාබැලීම මෙම අධ්‍යයනයෙන් අරමුණු කෙරෙයි. ස්වකීය රසිකයා සන්තර්පණය කිරීමේ කලාවේදියා සතු වගකීමට සීමා නොවී, රංගන ක්ෂේත්‍රයේ කාන්තාව පිළිබඳ වූ ආකල්පය වෙනස් කරලන්නටත්, දේශීය කලාව තුළ ප්‍රගතිශීලී නව මතවාද ස්ථාපනය උදෙසාත් රුක්මණී දේවියගෙන් ඉටු වූ කාර්යය විමර්ශනය කොට තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය විය. ඒ සඳහා රංගන හා ගායන ක්ෂේත්‍රය තුළ ඇයගේ නිර්මාණාත්මක සංලක්ෂණ මෙන් ම ක්‍රියාන්විත මැදිහත්වීම මෙහි දී අවධානයට පාත්‍ර කෙරිණි. ලිඛිත මූලාශ්‍ර, සිනමා පට ගීත මෙන් ම ඇයගේ කෘතීන්වල නිර්මාණ අධ්‍යක්ෂවරු, රසිකයින්, විචාරකයින්, පාර්ශවකරුවන් ඉදිරිපත් කළ අදහස් හා පැවැත්වූ නිර්මාණ සබඳතා ද විමසා බැලීම මේ සඳහා වැදගත් විය. සමකාලීන කලා ක්ෂේත්‍රයට වෙනස් මුහුණුවරක් එක් කරමින් දේශීය කලා රසිකයාගේ ප්‍රසාදයට හා ගෞරවයට සේ ම ජාත්‍යන්තර පිළිගැනීමට පාත්‍ර වන්නට තරම් වූ රුක්මණී දේවියගේ ප්‍රතිභාසම්පන්න දක්ෂතාව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇය ලත් ජයග්‍රහණ, සම්මාන, පිළිගැනීම්, කීර්තිය මෙරට කලාවේ දිදුලන යුගයක ආරම්භය සනිටුහන් කෙරුණු බව මෙහි දී පැහැදිලි විය. එමගින් ''නිළිය'' පිළිබඳ මෙරට තහවුරු වී තිබූ පොදු මතය වෙනස් වීමත්, නව පරම්පරාව තුළ රංගනය යන්න ජීවිතය හා ලෝකය ජයගත හැකි උසස් වෘත්තියක් ලෙසින් පිළිගැනීමට ලක් වීමත්, තාර්කික ව සනාථ කළ හැකි විය. ඒ සමග ම කලාකරුවා යනු මානවීය හා සමාජ සම්බන්ධතා ජාලයක කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන්නෙකු බව රුක්මණී දේවියගේ චරිත ලක්ෂණ ඔස්සේ සනාථ කර දැක්විණි.

**ප්‍රමුඛ පද:** කඩවුණු පොරොන්දුව; ද්විත්ව චරිත නිරූපණය; සිනමා සාහිත්‍යය; තරු සංකල්පය; ප්‍රාසංගික ශිල්පිණිය.